# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1991/52 - 2016 නොවැම්බර් මස 04 වැනි සිකුරාදා - 2016.11.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 7/2001

### 1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනත

1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනතේ 2 වන වගන්තිය යටතේ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මංගල සමරවීර පා.ම.,
විදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

2016 නොවැම්බර් මස 03 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2012 මැයි මස 31 වන දිනැති සහ අංක 1760/40 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2012 අංක 2 දරන එක්සත් ජාතීන්ගේ නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 2 වන නියෝගය ඉවත් කර පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

''2. ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීම සඳහා පුළුල් ක්‍රමෝපාය සමූහයක් නිශ්චිතව දක්වනු ලබන්නා වූ ද, විශේෂයෙන් ම (ඇෆ්ගනිස්ථාන ඉස්ලාම් එමීර් පාලන ප්‍රදේශය යනුවෙන් තමන් විසින් හඳුන්වනු ලබන) තලිබාන් යනුවෙන් සඳහන් කරනු ලබන ඇෆ්ගන් කණ්ඩායමට, (අයි. එස්. අයි. එල්., ඩා-එෂ් යනුවෙන් ද හඳුන්වනු ලබන) ඉරාක ඉස්ලාම් රාජ්‍ය සහ ලෙවාන්ත් සංවිධානයට සහ අල් කයිඩා සංවිධානයට එරෙහිව ගනු ලැබිය යුතු ක්‍රියාමාර්ග නිශ්චිතව දක්වනු ලබන්න වූ ද, 1267 (1999) දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා යෝජනා සම්මුතිය මගින් සහ ඒ යෝජනා සම්මුතියේ සම්බාධක තත්ත්‍රයට පසුව ගෙන එන ලද යෝජනා සම්මුති වන 1526 (2004), 1617 (2005), 1735 (2006), 1822 (2008), 1904 (2009), 1988 (2011), 1989 (2011) සහ 2253 (2015) දරන යෝජනා සම්මුති ද ඇතුළුව පසුව කරන ලද වෙනත් යම් යෝජනා සම්මුතියක් මගින් කරන ලද වෙනස් කිරීම් සහ සවිමත් කිරීම් මගින්, සම්බාධක පැනවීමේ කමිටුව විසින් නම් කරනු ලබන (මෙහි මින්මතු ''නම් කළ තැනැත්තා'' යනුවෙන් සඳහන් කරනු ලබන) තලිබාන්, අයි. එස්. අයි. එල්. (ඩා-එෂ්) හෝ අල්-කයිඩා සංවිධාන සමග සහයෝගීව ක්‍රියාකරන යම් ස්වභාවික හෝ නෛතික තැනැත්තකු, කණ්ඩායමක් හෝ ආස්තිත්‍යයක් වන්නා වූ ද සම්බාධක පැනවීමේ කමිටුව විසින් සම්මත කර ගන්නා ලද ''ඒකාබද්ධ ලැයිස්තුවේ'' නම් සඳහන් වූ ද තැනැත්තන් කෙරෙහි සම්බාධක පැනවීම සඳහා පියවර ගන්නා ලෙස එක්සත් ජාතීන්ගේ සාමාජික රාජ්‍යයන් මත බැඳීම් සමූහයක් පනවනු ලැබේ. එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ VII වන පරිච්ඡේදය යටතේ ක්‍රියා කරමින් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභාව විසින් 1999 ඔක්තෝබර් මස 15 වන දින 1267 (1999) දරන යෝජනා සම්මුතිය ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.'';


1A - PG 3216 — 457 (2016/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) 17 වන නියෝගයෙහි, ''සම්බාධක පැනවීමේ කමිටුව'' යන යෙදුමේ අර්ථ නිරූපණයෙහි (අ) ඡේදය ඉවත් කර පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන් ඃ-

''(අ) 1267 (1999), 1989 (2011), සහ 2253 (2015) දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා යෝජනා සම්මුති ප්‍රකාර පිහිටුවා ඇත්තා වූ, (අයි. එස්. අයි. එල්., ඩා-එෂ් යනුවෙන් ද හඳුන්වනු ලබන) ඉරාක සහ ලෙවාන්ත් ඉස්ලාම් රාජ්‍ය සංවිධානය, අල්-කයිඩා සංවිධානය සහ එම සංවිධාන ආශ්‍රිත තැනැත්තන් සහ ආස්තිත්‍යයන් සඳහා සම්බාධක පැනවීම සම්බන්ධයෙන් වගකිව යුතු ''1267/1989/2253 අයි. එස්. අයි. එල්. (ඩා-එෂ්) සහ අල්-කයිඩා සම්බාධක පැනවීමේ කමිටුව;''.

11 - 943

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.